විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව
ஓய்வூதியத் திணைக்களம்
DEPARTMENT OF PENSIONS

මාලිගාවත්ත ලේකම් කාර්යාලය, මාලිගාවත්ත, කොළඹ 10. மாளிகாவத்தை செயலகம், மாளிகாவத்தை, கொழும்பு 10. Maligawatte Secretariat, Maligawatte, Colombo 10.

අංකය / இல. / No. විවැ/චක්‍රලේඛ/2010 දිනය / திகதி / Date 2010- 12- 16

**විශ්‍රාම වැටුප් චක්‍රලේඛ 13/2010**

සියළුම අමාත්‍යාංශ ලේකම්වරුන් ,
පළාත් සභා ප්‍රධාන ලේකම්වරුන්,
දෙපාර්තමේන්තු ප්‍රධානීන්/ දිසා ලේකම්වරුන්/
ප්‍රාදේශීය ලේකම්වරුන්/ ත්‍රිවිධ හමුදාපතිවරුන්,

## වැන්දඹු/ වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් පනතේ සංශෝධන ක්‍රියාත්මක කිරීම

2010 අංක 8 දරණ වැන්දඹු හා අනත්දරු අරමුදලේ (සංශෝධිත) පනත හා 2010 අංක 9 දරණ වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප (සංශෝධන) පනත සංශෝධනයන් 2010 අගෝස්තු 17 දින සිට ක්‍රියාත්මක වේ. ඉහත සංශෝධන පනතේ විධිවිධාන වලට අනුව 2010 අගෝස්තු 17 දිනට පෙර අදාල සිද්ධීන් සම්බන්ධයෙන් ද හිමිකම් පෑමේ දිනය 2011- 12- 31 දින වශයෙන් නියම කොට ඇත. ඒ අනුව පහත සඳහන් සහන නව සංශෝධන පනතේ හිමිකර දී තිබේ.

1. ත්‍රස්තවාදී හේතු සහ ස්වාභාවික ආපදා මත මිය යන හිමිකම් ඇති රාජ්‍ය නිලධාරීන් වෙනුවෙන් අවසන් වරට ගෙවන වැටුප පදනම් කොට ගෙන වැන්දඹු/ වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප සංශෝධනය කිරීම.

2. අනියම් හා තාවකාලික තනතුරුලාභීන් ත්‍රස්තවාදී හේතු සහ ස්වාභාවික ආපදාමත මියගිය විට කලත්‍රයන්ට හා අනත්දරුවන්ට වැන්දඹු/ වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් හිමිගැන්වීම.

3. විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහයේ "ට" උපලේඛණයේ නිශ්චිතව සඳහන් කර ඇති විශ්‍රාම වැටුපකට හිමකම ලැබූ නිලධාරීන්ගේ කලත්‍රයන් සඳහා වැන්දඹු/ වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් ගෙවීම.

4. වයස අවු. 26 ට අඩු අනත්දරුවන්ට (ගැහැණු/පිරිමි දෙපාර්ශවය) විවාහය නොසලකා අනත්දරු විශ්‍රාම වැටුප් ගෙවීම.

5. තනතුරු අහෝසිකිරීම මත විශ්‍රාම ගන්වන ලද නිලධාරීන් වයස අවුරුදු 55 දක්වා සිදු කළ විවාහයන් පදනම් කොට ගෙන වැන්දඹු/ වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් හිමිකම ලබා දීම.


| | Telephone | Fax | | Telephone | Fax | | Telephone |
|---|---|---|---|---|---|---|---|
| Director General | 2431647 | 2342078 | W&OP | 2332346 | 2432214 | Policy | 2329580 |
| Director | 2432008 | 2342078 | PSPF | 2324375 | 2332347 | Forces | 2320439 |
| Director (F) | 2434974 | 2391403 | L.G.U. | 2342525 | 2342525 | Computation | 2434414 |
| Internal Auditor | 2329634 | 2329634 | Registration | 2329178 | - | Payments | 2431612 |

E-mail: pensions@sltnet.lk
Web site: www.pensions.gov.lk

6. ස්ථිර විශ්‍රාම වැටුප් සහිත වසර 10 කට වඩා වැඩි සේවා කාලයක් සම්පූර්ණකොට ඇති එහෙත් විශ්‍රාම වැටුප් අහිමි තත්වයට පත්වන නිලධාරීන් වෙනුවෙන් වැන්දඹු/ වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් හිමිකම ලබාදීම.

7. යළි විවාහ වන වැන්දඹුවන්ට හා වැන්දඹු පුරුෂයන්ට වැන්දඹු/ වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුපෙන් 50% ක් (හරි අඩක්) ගෙවීම.

පහත සඳහන් පරිදි ක්‍රියාකළ යුතුය.

1) 2010- 08- 17 දිනට පෙර අදාල සිද්ධීන් සම්බන්ධයෙන් හිමිකම් පාන පුද්ගලයින් තම ලිඛිත ඉල්ලීම 2011- 12- 31 දිනට පෙර විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව වෙත යොමු කළ යුතුය.

2) 2010- 08- 17 දිනට පසු සිදුවන අදාල සිද්ධීන් සම්බන්ධයෙන් ලිපිගොනු සකස් කිරීමේදී හා ප්‍රතිලාභ හිමිගැන්වීමේදී ආයතන ප්‍රධානීන් සහ ප්‍රාදේශීය ලේකම්වරුන් පනත්හි විධිවිධානයන්ට අනුව ක්‍රියාකළ යුතුය. ප්‍රතිලාභ හිමිගැන්වීමේදී අනුගමනය කළ යුතු ක්‍රියාමාර්ග පිළිබඳ උපදෙස් ඇමුණුම් (I) වශයෙන් ප්‍රාදේශීය ලේකම්වරුන් වෙත යැවීමට ක්‍රියාකරනු ලැබේ.

කේ .ඒ .තිලකරත්න
විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල්

පිටපත්: 01. ජනාධිපති ලේකම්.
02. අමාත්‍ය මණ්ඩල ලේකම්.
03. ලේකම් - රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව, නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යාංශය.
04. ලේකම් - මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශය.
05. ලේකම් - රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශය.
06. විගණකාධිපති.

## ඇමුණුම් 1

**වැන්දඹු/ වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් පනතේ සංශෝධන ක්‍රියාත්මක කිරීම ප්‍රතිලාභ හිමිගැන්වීම සඳහා ප්‍රාදේශීය ලේකම් උපදෙස්**
**(2010- 08- 17 දිනට පෙර සිදුවීම්)**

01. **ත්‍රස්තවාදී හේතුන් හා ස්වභාවික ආපදා මත මියයන රාජ්‍ය නිලධාරීන් වෙනුවෙන් වැන්දඹු අනත්දරු විශ්‍රාම වැටුප් ප්‍රතිලාභ ගෙවීම.**

1.1. විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවට ලැබෙන ඉල්ලීම් අනුමතකොට ප්‍රාදේශීය ලේකම්වරුන් වෙත එවනු ලැබේ.

1.2. අවසන් වරට ගෙවූ වැටුප පිළිබඳ තහවුරුවක් එම ආයතන ප්‍රධානීන්ගෙන් ලබාගත යුතුය.

1.3. වැටුප් ගෙවූ අවසන් දිනය දක්වා කාලය සේවා කාලය වශයෙන් ගණන් ගත යුතුය.

1.4. හිඟ දායක මුදල් අය නොකළ යුතුය.

1.5. සංශෝධන ප්‍රදාන පත්‍රයක් නිකුත් කොට 2010- 08- 17 දින සිට ගෙවීම ඇරඹිය යුතුය.

02. **අනියම් හා තාවකාලික තනතුරුලාභීන් ත්‍රස්තවාදී හා ස්වාභාවික හේතු මත මිය ගිය විට ප්‍රතිලාභ හිමිගැන්වීමද අදාල ඉල්ලීම් වලට අනුව වැන්දඹු අනත්දරු ලිපිගොනුව සකස් කොට ප්‍රදාන පත්‍රය පිළියෙල කොට ප්‍රාදේශීය ලේකම් වරුන් වෙත එවීමට ක්‍රියා කෙරේ.**

**03. "ට" උපලේඛණගත නිලධාරීන් වෙනුවෙන් ප්‍රතිලාභ හිමිගැන්වීම.**

අදාල ඉල්ලීමේ වලට අනුව වැන්දඹු අනත්දරු ලිපිගොනුව සකස් කොට ප්‍රදාන පත්‍රය පිළියෙල කොට ප්‍රාදේශීය ලේකම්වරුන් වෙත යැවීමට ක්‍රියා කෙරේ.

04. **අනත්දරු විශ්‍රාම වැටුප් ගෙවීම**

4.4. විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවට ලැබෙන ඉල්ලීම් අනුමත කොට ප්‍රාදේශීය ලේකම්වරුන් වෙත යවනු ලැබේ.

4.2. 2010- 08- 17 දිනට වයස අවුරුදු 26 සපුරා නොමැති රැකියා විරහිත අනත්දරුවන්ට ගෙවීම් සිදුකළ හැකිය.

4.3. වයස අවුරුදු 26 සපුරාලන විට ගෙවීම් නවතා දැමීමට ක්‍රියා කළ යුතුය.

4.4. බාලවයස්කාර අනත්දරුවන්ගේ ගෙවීම් හැකිතාක් දුරට ඔවුන් නමින් ගිණුම්ගත කිරීමට ක්‍රියාකළ යුතුය.

05. **තනතුරු අහෝසිවීම මත විශ්‍රාම ගැන්වූ නිලධාරීන් වෙනුවෙන් ප්‍රතිලාභ ගෙවීම**

5.1. විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවට ලැබෙන ඉල්ලීම් අනුමත කොට එවනු ලැබේ.

5.2. වයස අවුරුදු 55 සපුරන තෙක් දායක මුදල් අයකළ යුතුය.

5.3. ගෙවීම ඇරඹිය යුත්තේ 2010- 08- 17 දින සිටය.

5.4. සංශෝධන ප්‍රදාන පත්‍රය නිකුත් කළ යුතුය.

06. **ස්ථිර විශ්‍රාම වැටුප් සහිත වසර 10 ට වඩා වැඩි සේවා කාලයක් පැවතියද විශ්‍රාම වැටුප් අහිමි තත්වයට පත්වන නිලධාරීන් වෙනුවෙන් ප්‍රතිලාභ හිමි ගැන්වීම.**

6.1. අදාල ඉල්ලීම් වලට අනුව වැන්දඹු අනත්දරු විශ්‍රාම වැටුප් ලිපිගොනුව සකස් කොට ප්‍රදාන පත්‍රය පිළියෙල කොට ප්‍රාදේශීය ලේකම් වරුන් වෙත එවීමට ක්‍රියා කෙරේ.

07. **යලි විවාහ වන වැන්දඹු/ වැන්දඹු පුරුෂයන්ට විශ්‍රාම වැටුපෙන් 50% ක් ගෙවීම.**

7.1 විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවට ලැබෙන ඉල්ලීම් අනුමත කොට එවනු ලැබේ.

7.2 නීත්‍යානුකූලව විවාහ වී සිටිය යුතුය.

7.3 අනත්දරුවන්ගේ හිමිකම් සඳහා බාධාවක් නොවිය යුතුය.

7.4 වැන්දඹුවට යලිත් වැන්දඹු අනත්දරු විශ්‍රාම වැටුප් හිමිකම ලැබුනහොත් මුල් අයිතිවාසිකම (50%) අහෝසි විය යුතුය.

**කේ .ඒ .තිලකරත්න**
විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල්